ලිංගික අපරාධයක් හෝ ලිංගික අපයෝජනයක් හැඳින්වීම සඳහා "කෙළෙසීම" වැනි යෙදුම් යොදාගැනීම මාධ්‍ය තුළ ඇතැම් විටකදී දක්නට ලැබේ. කෙසේ වෙතත්, "කෙළෙසීම" වැනි යෙදුම් ඔස්සේ ලිංගික අපරාධයකට හෝ ලිංගික අපයෝජනයකට මුහුණ පෑ අය අපවිත්‍ර වී ඇති බවක්, කිලිටි වී ඇති බවක් ගම්‍ය වීමත්, එය ගර්හාත්මක සමාජ ආකල්පයකට ඉඩ පෑදිමට ඇති හැකියාව සහ, ඒ ඔස්සේ ඔවුන් කොන් කිරීමකට ලක්වීමට ඉඩක් තිබීම එවැනි යෙදුම් වල ඇති ගැටළුවයි.

එසේ නම්, "කෙළෙසීම" වැනි යෙදුමක් වෙනුවට ලිංගික අපරාධය හෝ ලිංගික අපයෝජනය වැනි යෙදුම් වඩාත් යෝග්‍ය නොවන්නේ දැයි පාඨක අප විමසිය යුතුයි.

ඒ අනුව, එකම සිදුවීමක් වාර්තා කරනා පහත සිරස්තල දෙකෙන්, වඩාත් යෝග්‍ය යැයි ඔබ තෝරාගන්නේ කුමන සිරස්තලයද?

1) "පාසලේ ගුරුවරයකු අතින් සිසුවියක් කෙලෙසිලා" - මව්බිම (ජනවාරි 06, 2022)
2) "පාසල් ශිෂ්‍යාවට අතවර කළ ගුරුවරයා රිමාන්ඩ්" - දිවයින (ජනවාරි 06, 2022)